# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1798/15 - 2013 පෙබරවාරි මස 19 වැනි අඟහරුවාදා - 2013.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් අත්පත්කර ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධිවිධාන යටතේ ආඥාව

**2013 අංක 48 දරන ආඥාව**

මගේ යොමු අංකය : 4/3/10/2012/යූඩීඒ/413.
ප්‍රා. ලේ. ගේ. යොමු අංකය : ඇප්‍රාලේ/3/1/නගර/සං/1.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය, ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

*උපලේඛනය*

| *I වැනි තීරය*<br>*ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී* | *II වැනි තීරය*<br>*ඉඩමේ විස්තරය* |
|---|---|
| ප්‍රාදේශීය ලේකම්, කොළඹ | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, (කොට්ඨාස අංක 20-කොටුව මහ නගර සහා සීමාව තුළ) කොටුව ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියල කරන ලද අංක CO/COL/2013/47 හා 2013.02.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර A වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2964 ක් පමණ වූ පහත නම් සඳහන් ඉඩම් කොටසට මායිම් : |

1. කැබලි අක්ෂර A ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ වරිපනම් අංක 36, 40, 50, 81, 91, 95, 107, 115, 99 1/1, 99 1/3, 99 1/4, 99 1/5, 99 1/6, 99 1/10, 99 1/12, 99 1/15, 99 1/16, 99 1/17, 9 91/18, 99 1/1/20, 99/122, 99, 991/30, 99 1/32, 99 1/34, 99 1/36, 99 2/1, 99 2/4, 99 2/6, 99 2/8, 99 2/12, 99 2/14, 99 2/18, 99 2/24, 99 2/26, 99 2/30, 99 2/32, 99 2/34, 99 2/36, 99 2/38, 99 2/42, 99 2/48, 99 2/54, 99 2/56, 99 2/63, 99 2/66, 99 2/70, 99 3/1, 99 3/7, 99 3/12, 99 3/20 සහ 99 3/25 දරන ඉඩම ප්‍රමාණය හෙක්. 0.2964.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ලේඩන් බැස්ටියන් පාර ; |
| *නැගෙනහිරට* | : | ලේඩන් බැස්ටියන් පාර සහ ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත; |
| *දකුණට* | : | ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත ; |
| *බටහිරට* | : | ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත සහ ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ, වරිපනම් අංක 75 දරන ඉඩම. |

03-329

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.